
# විවිධ සතුන් හඳුනා ගනිමු.



ආර්.එම්.මෙතුලි මෝක්ෂා දිසානායක

# විවිධ සතුන් හඳුනා ගනිමු

ආර්.එම් මෙතුලි මෝක්ෂා දිසානායක

කතෘ

පළමු දිගහැරීම

මහාමායා බාලිකා විද්‍යාලය

2 ශ්‍රේණිය B

2026. 05. 10

ISBN: 9786242113692

# පිදුම

අම්මාටත් තාත්තාටත්
මල්ලීටත්

පන්තිභාර
ගුරුතුමියටත්

ආදරයෙන් මේ පොත්
පිංච පුදමි



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# පටුන


පිදුම ........................................................................ ii

පෙරවදන........................................................................iii

සුභාශිංසන පණිවුඩය........................................................ iv

සුභාශිංසන පණිවුඩය..........................................................v

පටුන..........................................................................vi

ලේනා..........................................................................1

බැටලුවා.......................................................................2

අලියා..........................................................................3

කොටියා........................................................................4

මොනරා........................................................................5

මාලුවා..........................................................................6

ගිරවා..........................................................................7

පූසා............................................................................8

කිඹුලා..........................................................................9

ඉත්තෑවා........................................................................10

පසුවදන........................................................................vii

# ලේනා



ලේනා අහිංසක සතෙකි. උෟ ගස් බෙනයක කූඩු සාදයි. පළතුරු කන්න හරිම ආසයි. ඔවුන්ගේ ඉදිරි පාද කොටයි. පිටුපස පාද දිගයි. ඒ නිසා උෟට වේගයෙන් දුවන්න ට පුලුවන්. පිට මැද ඉරි තුනක් තියෙන නිසා තුන් ඉරියා කියලත් කියනවා.

# බැටළුවා



බැටළුවා සිවුපා සතෙකි. බැටළුවෝ ශීත රටවල ජීවත් වෙනවා. ඌගේ ඇඟ පුරාම ලොම් තිබෙනවා. ඒ ලොම් රෙදි වියන්න ගන්නවා. ඒ වගේම බැටළුවාගේ මස් කෑමට ගන්නවා. බැටළු හම බඩු හදන්නත් ගන්නවා. ඌ කන්නේ තණ. උන් කොටු වල දමා ඇති කරනවා.

# අලියා



කැලේ සිටින ලොකුම සතා අලියා ය. ඌට විශාල කන් දෙකක්, කකුල් හතරක්, හීනි ඇස් දෙකක් තිබෙනවා. අලියාට දිග හොඬ වැලක් තිබෙනවා. ඌ හුස්ම ගන්නේත්, පහසුවෙන් කෑම කන්නේත්, කොට අදින්නෙත් සතුන්ට පහර දෙන්නෙත් හොඬ වැල නිසා. අලියා කොයි තරම් විශාල වුණත් මස් කන්නේ නැහැ.

# කොටියා



කොටියා කිරි බීලා වැඩෙන සිවුපාවෙකි. ඌ අපිට දකින්න පුලුවන් සත්තු වත්තේ දි. කොටියා වැඩිපුරම කන්නේ සත්තුන්ගේ මස්. ඔවුන් දහවල් කාලයේදි විවේකයෙන් ඉන්නවා. රෑ කාලයේ කෑම සොයා ඇවිදිනවා.

# මොනරා



මොනරා වියළි කලාපයේ දකින්න පුලුවන්. මොනරා අනිත් කුරුල්ලොන් ට වඩා විශාලයි. ඌ ට ලස්සන පිල් කළඹක් තිබෙනවා. ඌට ලස්සනට නටන්නත් පුලුවන්. මොනරාගේ ගැහැණු සතා සෙබඩ. ඒත් සෙබඩට වඩා මොනරා හරිම ලස්සනයි.

# මාළුවා



මාළුවා ජලයේ ජීවත් වෙනවා. ගොඩක් අය ටැංකි වල දමා මාළුවන් ඇති කරනවා. මාළුවෝ ගොඩක් වර්ග සිටිනවා. ඌගේ ආරක්ෂාවට ඇඟ පුරාම කොරපොතු තිබෙනවා. මාළුවාට නහයක් තිබෙනවා. ඒත් ඌ හුස්ම ගන්නේ වරල් වලින්

# ගිරවා



ගිරවුන් සිටින්නේ රංචු පිටින්. ගිරවාගේ ශරීරය කොළ පාටයි. හොට රතු පාටයි. උෟ කන්නේ පළතුරු, ඇට වර්ග සහ මල් පොහොට්ටු ය. ගිරවුන් සිටින්නේ ගස් බෙනවල ය. ගිරවිය වරකට බිත්තර දෙකක් පමණක් දමනවා. උෟට මිනිසුන්ගේ හඬ අනුකරණය කරන්නත් පුළුවන්.

# පූසා



පූසාට බළලා කියලත් කියනවා. පූසාට මිනිස්සු ආදරේ කරනවා. ඌ දවසේ වැඩි කාලයක් නිදා ගන්නවා. රෑ කාලයේ කෑම සොයනවා. මීයන් අල්ලන්න හරි ම කැමතියි. ඌ සිවුපාවෙකි. පූසාගේ ශරීරය පුරා ලොම් තිබෙනවා. ඒ නිසා ඌට සීතල දැනෙන්නේ අඩුවෙන් ය.

# කිඹුලා



කිඹුලා ජලයේ ජීවත් වෙනවා. කිඹුලා මස් කන සතෙකි. ඌ ගොදුර එකවර ගිල දමන නිසා ඌට මාසයක් බඩගින්නේ සිටින්න පුළුවන්. කිඹුලාට මිනිස්සු බයයි. කිඹුලි බිත්තර 10-60ක් දානවා. උන් ගංගා සහ වැව්වල සිට මුහුද ට කෑම සොයා ගෙන යනවා.

## ඉත්තෑවා



ඉත්තෑවා කිරි බීලා වැඩෙන සතෙක්. ලඳු කැළෑවල ඌ ජීවත් වෙනවා. ඉත්තෑවා අපට රෑ කාලයේ දකින්න පුලුවන්. දහවල් කාලයේ ඌ ගුල තුළ රිංගා සිටිනවා. ඉත්තෑවා ධාන්‍ය, පළතුරු, පොල් කනවා. ඉත්තෑවගේ ආරක්ෂාව ට පිට පුරා කූරු තිබෙනවා. ඒ නිසා ලොකු කුඩා කවුරුත් ඌ ළඟට ළං වෙන්න බයයි.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවරිධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් ''හේමමාලා උපහාර'' ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලූ ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.